# මට දැන් පුළුවන්



හෙසඳු සෙන්හිරු කරවිට

# මට දැන් පුළුවන්

## හෙසඳු සෙන්හිරු කරවිට

කතෘ

කතෘගේ වෙනත් කෘති

**දඟකාර සුපුන්**

ධර්මරාජ විද්‍යාලය

4 ශ්‍රේණිය

2026-05-10

# පිදුම

මගේ අම්මාට අප්පච්චිට හා මට
අකුරු කියා දෙන ගුරු මව්වරුන්ට හා
පියවරුන්ට ආදරයෙන් පුද කරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ  වන ගෝලීය අනාගත ලෝකයට දියනියන් සූදානම් කරන හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන්  සිදුකරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නම්කල හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනාවක් දැයේ දරුවන්  ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහනයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරනයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුහවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක පොහොසත් ළමයෙක් හිටියා.



එයාගේ නම  මෙවිනු.

ඒ ගෙදරට පිටිපස්සේ ගෙදර පිනිදු කියලා දුප්පත් ළමයෙක් හිටියා.



පොහොසත් ළමයාට ගොඩාක් සෙල්ලම් බඩු තිබුණා.

එයාට ලස්සන බයිසිකලයක් තිබුණා.

ඒත් එයා බයිසිකලේ පදින්න දන්නේ නැහැ.



පිනිදුට සෙල්ලම් බඩු මොකුත් නැහැ.

එයා හිටියේ ගොඩාක් දුකෙන්.

පිනිදූට බයිසිකලයක් නැති උනාට එයාට
බයිසිකලයක් පදින්න පුලුවන්.



දවසක් මෙවිනු පාරේ බයිසිකල් පදින්න ගියා.

පිනිදු ඒක දැකලා එතනට ආවා.

“අනේ ලස්සන බයිසිකලයක්” කියලා පිනිදු කිව්වා.

“අනේ මට බයිසිකලය පදින්න බැහැ” කියලා මෙව්නු කිව්වා.

“මම ඔයාට බයිසිකල් පදින්න පුරුදු කරන්නම්”
කියලා පිනිදු කිව්වා.

මෙවිනුට හරිම සතුටුයි.එයා පිනිදුගෙන් බයිසිකල්
පදින්න ඉගෙන ගත්තා.

“අනේ මටත් පදින්න දෙනවද මේ බයිසිකලය “
පිනිදු ඇහුවා.

හරි ඔයත් පදින්න මෙවිනු කිව්වා.

දෙන්නා සතුටින් බයිසිකලය පැද්දා.

පසු දින මෙවිනු තාත්තට කියලා අලුත්ම



බයිසිකලයක් පිනිදූට ගෙනත් දුන්නා.

පිනිදූට හරිම සතුටුයි.

# මෙවිනුටත් හරිම සතුටුයි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කල මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිලිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කලයුතුබව පර්යේශනාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යයාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී අති පොත්පතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගනනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යයාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුල ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියනියන් විදුහල්පතිතුමිය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩනනිලමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN අංකය

978-624-211-105-6